## ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය - 2015

---------------------------------------------

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උපවගන්තිය ප්‍රකාරව විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම.

---------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට **(ISSAI 1000 – 1810)** අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂයපථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 111 වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම.

---------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන
------------------

2.1 තත්ත්වාගණනය කළ මතය
----------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-------------------------------------------

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති
------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 ප්‍රකාරව නීතිමය කටයුතු නිරවුල් කිරීමේ වියදම් වෙනමම මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ හෙළිදරව් කළ යුතු වුවත් විශ්වවිද්‍යාලයේ නිලධාරියෙකුට ගෙවා තිබුණු රු. 162,610ක වන්දි මුදල පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල වෙනමම හෙළිදරව් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 09 ප්‍රකාරව ජීව විද්‍යාත්මක වත්කම් ලෙස ගැනෙන කෘෂිකර්ම පීඨය සතු පශු සම්පත් තොග වටිනාකම සාධාරණ අගය මත ගිණුම්ගත කිරීමට කටයුතු නොකර පශු සම්පත් මිලදී ගන්නා ලද පිරිවැයට වාර්ෂිකව සියයට 20 බැගින් ක්ෂය කර ශුද්ධ අගය පමණක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කෘෂිකර්ම පීඨයේ නව ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ලබාදුන් වැඩ අත්තිකාරම් හා විශ්වවිද්‍යාලයට පිහිනුම් තටාකයක් ඉදිකිරීම සඳහා ලබාදුන් වැඩ අත්තිකාරම් ශේෂය ලෙජරයට අනුව පිළිවෙලින් රු.10,340,982 ක් හා රු.29,060,008 ක් වුවද, එය මූල්‍ය ප්‍රකාශනවල පිළිවෙලින් රු.8,132,028 ක් හා රු.24,579,116 ක් ලෙස දක්වා තිබීමෙන් මූල්‍ය ප්‍රකාශනවල තුල්‍යතාවය විගණනයේදී ප්‍රශ්නකාරී විය.

(ආ) සමාලෝචිත වර්ෂය තුල කෘෂිකර්ම පීඨයට මිලදී ගෙන තිබුණු රු.100,000 ක් වටිනා කුකුල් පැටවුන් 200 කගේ සහ වර්ෂයේ උපත ලද වසු පැටවුන් 07ක්, එළු පැටවුන් 04ක්, බැටළු පැටවුන් 01ක් ලෙස එකතුව සතුන් 12කගේ වටිනාකම ගණනය කර මුළු වටිනාකම පශු සම්පත් තොගයට ඇතුළත් කර නොතිබුණි.

2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්
-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාවලින් සකස්කරන ලද උපලේඛන අනුව වූ තොග ශේෂ හා මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන තොග ශේෂ අතර රු.715,573 ක වෙනසක් විය.

(ආ) පරිගණකගත ස්ථාවර වත්කම් ලේඛනයේ හා මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ස්ථාවර වත්කම් විෂයයන් 11 ක් අතර රු.1,204,507,511ක වෙනසක් නිරීක්ෂණය විය.

2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

-----------------------------------

පහත සඳහන් සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(අ) පුස්තකාල පොත් සම්බන්ධයෙන් 2014 වර්ෂයේදී සිදුකර තිබුණු සමීක්ෂණයට අදාළ වාර්තාව 2016 ජූලි 31 දින වන විටත් ඉදිරිපත් කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගිණුම් අනුව වූ රු. 18,561,114ක පුස්තකාල පොත් හා වාර සඟරාවල භෞතික පැවැත්ම විගණනයේදී තහවුරු කරගත නොහැකි විය.

(ආ) කෘෂිකර්ම පීඨයට අයත් ගොවිපලේ රු.38,850 ක් වටිනා විවිධ වර්ගවලට අයත් සතුන් 38 දෙනෙක් සමාලෝචිත වර්ෂය තුලදී මියගොස් තිබුණු අතර, ඒ සම්බන්ධයෙන් වූ පශු වෛද්‍ය වාර්තා හෝ අදාළ වෙනත් ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකරන ලදී.

2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පර්යේෂණ අත්තිකාරම් පියවිය යුතු කාලය ඉක්මවා මාස 03 සිට මාස 32 දක්වා කාලයක් ගතවී තිබෙන එකතුව රු.1,014,565ක් වූ ශේෂ 10 ක් අයකරගැනීමට සමාලෝචිත වර්ෂය තුලදීද කටයුතු කර නොතිබුණි.

(ආ) විශ්වවිද්‍යාලයේ ජල ව්‍යාපෘතියක් සඳහා 2008 වර්ෂයේදී ලබාදී තිබුණු රු.388,003ක් සහ ප්‍රධාන පරිපාලන ගොඩනැගිල්ලේ වැසිකිළි පද්ධතිය නවීකරණය සඳහා 2012 වර්ෂයේදී ලබාදී තිබුණු රු.487,485 ක් වූ වැඩ අත්තිකාරම් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

2.4 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

------------------------------------------------------------------------

පහත සඳහන් නීති රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව | | අනුකූල නොවීම |
| --- | --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | |
| **(i)** | මුදල් රෙගුලාසි 381(1) | භාණ්ඩාගාර අනුමැතිය ලබාගැනීමකින් තොරව විශ්වවිද්‍යාලය විසින් බැංකු ජංගම ගිණුමක් ආරම්භ කර තිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 570 | වර්ෂ 2 සිට වර්ෂ 8 දක්වා කාලයක් ගිණුම්වල රඳවාගෙන තිබෙන රු.7,022,040 ක කොන්ත්‍රාත් රැඳවුම් මුදල් සම්බන්ධයෙන් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

(ආ) 2015 මැයි 25 දිනැති අංක පීඊඞී**1/2015** දරන රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛයේ 3 ඡේදය

නිල වාහන භාවිතයට හිමිකම් ඇති නිලධාරීන් තිදෙනෙකු විසින් අනුමත සීමාව ඉක්මවා ලබාගෙන තිබුණු රු.330,426ක් වටිනා ඉන්ධන ලීටර් 2,512 ක් සම්බන්ධයෙන් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව අදාළ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

2.5 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු
---------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) භාණ්ඩාගාර චක්‍රලේඛ ප්‍රතිපාදන හෝ අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය හා භාණ්ඩාගාර එකඟතාවය නොමැතිව අධ්‍යයන කාර්ය මණ්ඩලය රඳවාගැනීමේ දීමනා ලෙස වෛද්‍ය පීඨයේ මහාචාර්ය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය හා ආධුනික කථිකාචාර්යවරුන් සඳහා පිළිවෙලින් මාසිකව රු.100,000 ක් , රු.80,000 ක් හා රු.50,000 ක් වූ ගෙවීම් සිදුකර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය සඳහා රු.20,142,386ක් ද ඉකුත් වර්ෂය සඳහා රු.4,782,500 ක්ද වශයෙන් එකතුව රු. 24,924,886 ක් ගෙවා තිබුණි.

(ආ) රාජකාරී ගමන් යන නිලධාරියෙකුට දෛනික සංයුක්ත දීමනාවට අමතරව ගමනේ දුර පදනම් කරගෙන දිනකට රු.500 සිට රු.1,500 දක්වා වෙහෙසකර දීමනා ලෙස සමාලෝචිත වර්ෂය තුළදී එකතුව රු.191,600 ක් පාලක මණ්ඩල අනුමැතිය මත ගෙවා තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය
------------------------

3.1 මූල්‍ය ප්‍රතිඵල
-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ මෙහෙයුම් කටයුතුවලින් රු.116,769,950ක ඌනතාවයක් ඇති වී තිබුණු අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 4,645,369ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.121,415,319 ක පිරිහීමක් නිරීක්ෂණය විය. සේවක පාරිශ්‍රමික වියදම් රු.174,939,261 කින් වැඩිවීම ඉහත පිරිහීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා ඌනතාවය ක්‍රමයෙන් අඩුවී 2014 වර්ෂයේදී අතිරික්තයක් ඇති වී තිබුණද නැවත 2015 වර්ෂයේදී ඌනතාවයක් ඇති වී තිබුණි. එය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 2614කින් පිරිහීමකි. කෙසේ වුවද සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂයවීම් සැලකීමේදී 2011 වර්ෂයේ රු.332,295,581 ක්වූ දායකත්වය 2015 වර්ෂයේදී රු.932,609,548 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි.

4 මෙහෙයුම් සමාලෝචනය
-----------------------------

4.1 කාර්යසාධනය
-------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාල පනතේ 46 (5) වගන්තිය ප්‍රකාරව විශ්වවිද්‍යාලයේ එක් එක් පීඨ සම්බන්ධ අධ්‍යයන ප්‍රගතිය සනාතන සභාව විසින් පරීක්ෂාකර ඇගයීමට ලක්කර තිබූ බවට සාක්ෂි, සනාතන සභා රැස්වීම් වාර්තා පරීක්ෂාවේදී තහවුරු නොවූ අතර අධ්‍යයන කාර්යසාධන වාර්තා එක් එක් පීඨ

හෝ දෙපාර්තමේන්තු විසින් පීඨ මණ්ඩල රැස්වීම් වෙත ඉදිරිපත් කර තිබූ බවටද සාක්ෂි නොතිබුණි.

(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් හඳුන්වා දී ඇති අධ්‍යයන කාර්යය මණ්ඩලය සඳහා අධ්‍යයන කටයුතු පිළිබඳ ගෙවීම් පරිචය (Loads of practices on academic accountability for academic staff in sri lankan University System) යටතේ වූ ඉටුකල යුතු සම්මත ප්‍රමාණයන් (Work norms )අනුව එක් එක් දේශකවරුන් විසින් වර්ෂය තුල ආවරණය කළ යුතු ශිෂ්‍ය සම්බන්ධතා පැය ප්‍රමාණය සිය කාලසටහන් මඟින් ආවරණය විය යුතු බව දක්වා තිබුණි. ඒ අනුව නියැදි විගණන පරීක්ෂණයට භාජනය කරන ලද කළමනාකරණ පීඨයේ දේශකවරුන් 14 දෙනෙකු විසින් ආවරණය කළ යුතු දේශන පැය 5,275කින් දේශන පැය 2,882ක් ආවරණය කර නොතිබුණි.

(ඇ) 2015 වර්ෂයේ පර්යේෂණ කළමනාකරණ කමිටුව විසින් අනුමත කර ආරම්භ කරන ලද පර්යේෂණ 34ක් වෙනුවෙන් 2015 දෙසැම්බර් 31 දින වන විට රු. 6,353,213 ක වියදමක් දරා තිබුණි. ඉන් පර්යේෂණ 9 ක සය මාසික අන්තර් පර්යේෂණ වාර්තා ඇතුලත් ප්‍රගති වාර්තා පර්යේෂණ කමිටුව වෙත ඉදිරිපත් කර නොතිබුණු අතර, පර්යේෂණ කාල සීමාව අවසන් වූ පර්යේෂණ 19ක අවසන් වාර්තා ද ඉදිරිපත් කර නොතිබුණි.

(ඈ) 2012 වර්ෂයේ සිට 2014 දෙසැම්බර් 31 දින දක්වා පර්යේෂණ හා කළමනාකරණ කමිටුව විසින් අනුමත කරන ලද පර්යේෂණ 26 ක් සඳහා රු.5,436,700ක ප්‍රතිපාදන වෙන්කර පර්යේෂණ අරමුදලේ රඳවාගෙන තිබෙන අතර, සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම එම ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබීම හේතුවෙන් වෙනත් ප්‍රමුඛතාවය දියයුතු පර්යේෂණ සඳහා ප්‍රතිපාදන වෙන්කිරීමට තිබූ අවස්ථාව අහිමි වී තිබුණි.

(ඉ) මාසික වැටුප් සමඟ රු.4,915,743 ක් වූ පර්යේෂණ දීමනා ලබාගෙන තිබුණු අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් 155 දෙනෙකු විසින් පර්යේෂණ ප්‍රගතිය ඇතුළත් අන්තර් අවසන් පර්යේෂණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

(ඊ) 2013 සහ 2015 වර්ෂවලදී කළමනාකරණ පීඨයේ අවසන් වසර විභාගයට පෙනී සිටි සිසුන්ගෙන් පිළිවෙලින් සියයට 23 ක් සහ සියයට 21 ක් වශයෙන් සිසුන් අසමත් වීම සහ පීඨයේ පළමු පෙළ සාමාර්ථ සහිතව සමත් සිසුන් සංඛ්‍යාව පසුගිය වර්ෂ 03 සඳහා එක් ශිෂ්‍යයෙක් පමණක් වීම හේතුවෙන් අධ්‍යයන කටයුතු සම්බන්ධයෙන් පසු විපරම් කිරීමේ අවශ්‍යතාවයක් නිරීක්ෂණය විය.

(උ) ව්‍යවහාරික විද්‍යා පීඨයේ පාඨමාලා 03 ක සමාලෝචිත වර්ෂය තුළ පැවති අවසන් වසර විභාග ප්‍රතිඵල නිකුත් කිරීම මාස 06 සිට මාස 10 දක්වා කාල ප්‍රමාදයක් සහිතව සිදුවී තිබුණි.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පීඨයේ ජ්‍යෝෂ්ඨ කථිකාචාර්යවරියක් වර්ෂ 2 මාස 9 ක කාලයකදී පශ්චාත් උපාධිය හැදෑරීම සඳහා විදේශගත වීමට විශ්වවිද්‍යාලය සමඟ රු.2,250,000 ක බැඳුම්කරයකට එළඹ තිබූ අතර, එම ආචාර්යවරිය අදාළ පාඨමාලාව සම්පූර්ණ කරගැනීමකින් තොරව නැවත දිවයිනට පැමිණ සේවයට වාර්තා කර තිබුණි. ඒ අනුව පශ්චාත් උපාධිය හැදෑරීම සඳහා විදේශගත වීමට ලබාගෙන තිබුණු මුදලින් වැයකරන ලද රු.651,338 ක මුදල විශ්වවිද්‍යාලයට නැවත අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පීඨයේ ජ්‍යෝෂ්ඨ කථිකාචාර්යවරියක් සඳහා වර්ෂ 3 ක විදේශීය පශ්චාත් උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා රු. 4,116,719ක වටිනාකමකට 2011 ජූනි 01 දින විශ්වවිද්‍යාලය සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. ගිවිසුම අනුව 2014 සැප්තැම්බර්

01 දින සේවයට වාර්තා කල යුතු වුවද ඇය විසින් සේවයට වාර්තා නොකිරීම නිසා එදින සිට සේවය අතහැර ගියා ලෙස සලකා තිබුණි. 2016 අප්‍රේල් මාසය වන විටත් ගිවිසුම් කඩ කිරීමෙන් සිදුවූ අලාභය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) කෘෂිකර්ම පීඨය පුළුල් කිරීමේ කටයුතු සඳහා අක්කර 15ක පමණ ඉඩමක් අත්පත් කර ගැනීම වෙනුවෙන් 2011 වර්ෂයේදී මධ්‍යම නුවරගම් පළාත් ප්‍රාදේශීය ලේකම් වෙත රු.7,200,000ක මුදලක් තැන්පත් කර ඇතත්, අදාල පවරාගැනීම සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් සම්පූර්ණ කර ගෙන නොතිබුණි.

(ඈ) විශ්වවිද්‍යාල භූමිය තුල පිහිටි පොලිස් නිවාස 40 ක් හා එම ඉඩම් විශ්වවිද්‍යාලයට අත්පත් කර ගැනීම සඳහා මහා භාණ්ඩාගාරය විසින් රු.මිලියන 18 ක් 2006 වර්ෂයේදී විශ්වවිද්‍යාලයට ලබාදී තිබුණද එම භූමිය නිදහස් කර ගැනීමේ කටයුතු සමාලෝචිත වර්ෂය අවසන් වනවිටද නිම වී නොතිබුණි.

4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

------------------------------

ශිෂ්‍ය නේවාසිකාගාරවලට බවුසර් මගින් ජලය සපයා ගැනීම සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අතිරේක 28හි 2.14.1ට අනුකූල නොවන අයුරින් කටයුතු කරමින් මිල ගණන් කැඳවීමකින් තොරව විශ්වවිද්‍යාලයේ ආචාර්යවරයෙකු ඉදිරිපත් කරන ලද මිල ගණන් මත බවුසර් මගින් ජලය සැපයීමේ සේවාව ඔහු වෙත පවරා සමාලෝචිත වර්ෂය තුල රු.6,720,200 ක් ගෙවා තිබුණි. එසේම එම බවුසර්වල අයිතිය ලංසුකරු සතු වන බවට තහවුරු නොවීය.

4.4 ආර්ථික නොවන ගනුදෙනු

--------------------------------

කුලී පදනම මත පවත්වාගෙන ගිය නේවාසිකාගාරවලින් ඉවත් කර තිබූ එහෙත් සුළු අලුත්වැඩියාවන්වලින් පසු භාවිතයට ගත හැකි යකඩ ඇඳන් 1000 ක් වානේ අල්මාරි 80 ක් හා ලී පුටු 112 ක් නැවත ප්‍රයෝජනයට ගැනීමට ඇති හැකියාව පිළිබඳ සලකා බැලීමකින් තොරව සමාලෝචිත වර්ෂය තුළ ලී ඇඳන් 436 ක්, වානේ අල්මාරි 80 ක් හා ලී පුටු 112 ක් අලුතෙන් මිලදී ගැනීම සඳහා රු.14,911,827 ක් වැයකර තිබුණි. තවද, එම නේවාසිකාගාරවල තිබුණු හොඳ තත්ත්වයේ යකඩ ඇඳන් 191 ක්, වානේ අල්මාරි 52 ක් හා ඇඳුම් රාක්ක 77 ක් රු.291,100 කට අබලි භාණ්ඩ ලෙස වෙන්දේසි මගින් අළෙවි කර තිබුණි.

4.5 කොන්ත්‍රාත් ක්‍රියාවලිය

--------------------------

රසායනාගාර උපකරණ (Heating Mental) 3ක් මිලදී ගැනීම සඳහා සිදුකරන ලද ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් අදාල උපකරණවලට ISO සහතිකය ඉදිරිපත් කර නොමැති බැව් සඳහන් කරමින් අවම මිල ඉදිරිපත් කරන ලද ලංසුකරු ප්‍රතික්ෂේප කර තිබුණි. ඒ අනුව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.8.9 ඡේදය ප්‍රකාරව සහතිකයේ පිටපතක් ඉදිරිපත් කර නොතිබීම සුළුබැහැරවීම් ලෙස සැලකිය හැකි බැවින් අදාල ලංසුකරු විමසා සහතිකයේ පිටපත් ගෙන්වාගෙන ලංසු ඇගයීම් සිදු කිරීමෙන් තොරව ඊලඟ වැඩි මිලට එම උපකරණ මිලදී ගැනීම හේතුවෙන් විශ්වවිද්‍යාල අරමුදලට රු. 194,400ක අලාභයක් සිදුවී තිබුණි.

4.6 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

--------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලය සතු බැංකු ජංගම ගිණුමක රු. 906,230ක ශේෂයක් 2012 වර්ෂයේ සිට අක්‍රියව පැවතුණි.

(ආ) විශ්වවිද්‍යාලයේ පර්යේෂණ දිරිගැන්වීමේ අරමුණින් විවිධ ආයතනයන්ගෙන් ලැබී තිබුණු රු.1,585,259 ක්වූ පර්යේෂණ ප්‍රදානයන් වර්ෂ 02 සිට වර්ෂ 03 අතර කාලයක සිට උපයෝජනය නොකර නිෂ්කාර්යව තිබුණි.

4.7 අරමුදල් ඌන උපයෝජනය

-----------------------------------

බැංකු ජංගම ගිණුමක 2015 වර්ෂය මුළුල්ලේ රු. මිලියන 1.2කට වැඩි සාමාන්‍ය ශේෂයක් පැවති අතර විශ්වවිද්‍යාලයේ සංවර්ධන කටයුතු සඳහා එය යොදාගැනීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණි.

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

-----------------------------------------

5.1 අභ්‍යන්තර විගණනය

------------------------

විශ්වවිද්‍යාලයේ පීඨ 5 ක සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රයෙහි කටයුතු පරීක්ෂා කිරීම සඳහා මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව අභ්‍යන්තර විගණනය වෙත පැවරී ඇති කාර්යයන් ඉටු කිරීම වෙනුවෙන් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විගණන අංශයට ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් අනුමත කර ගැනීමකින් තොරව සියළුම අභ්‍යන්තර විගණන කටයුතු සඳහා එක් නිලධාරියෙක් පමණක් අනුයුක්ත කර තිබුණි.

6. පද්ධති හා පාලනයන්

-------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) කොන්ත්‍රාත් පාලනය | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව වැඩ සහ සැපයීම් සම්බන්ධ කොන්ත්‍රාත් පරිපාලන කටයුතු සිදු නොකිරීම. |
| (ආ) කාර්ය මණ්ඩල පරිපාලනය | අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය ඇගයීමට ලක්කර අනුමත කාර්ය මණ්ඩලය යාවත්කාලීන කර ගෙන නොතිබීම. |
| (ඇ) වාහන පාලනය | විශ්වවිද්‍යාලයේ සංචිත වාහනවල ඉන්ධන භාවිතය හා ධාවන සටහන් පැවැත්වීම යාවත්කාලීන නොකිරීම |
| (ඈ) පර්යේෂණ පාලනය | විශ්වවිද්‍යාලයේ අනුමත පර්යේෂණ මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව කටයුතු නොකිරීම. |